# ගොවි ජනතාවයි වෙළෙඳපොළයි

**සමාජ ආර්ථික වශයෙන් ඔවුන්ට අඩුවක් පාඩුවක් වෙලා නැහැ. ගොවියා රජකමට සුදුසු යැයි කියන්න ඇත්තෙත් මේ නිසා. ඒත් අද.......? අද ගොවියා හෙළන දහඩියවල වටිනාකම ඔවුන්ට ලැබෙනවාද? මානසික වශයෙන් සැනසීමක් ඔවුන්ට තිබෙනවාද? අද වෙළඳපොළ දිහා බැලුවත් පේන්නේ දහඩිය මහන්සිය වපුරන අයට වඩා ඒකේ ලාභය ලබන්නේ වෙනත් පිරිසක් බවයි.**

බත බුලත තිබඳව සපයා දෙන ගොවියා රජකමට පවා සුදුසු යැයි පුරාණයේ සිටම පිළි ගැණුනා. ඔවුන් හෙළන දහඩිය බිඳුවක් ගානේ කුසගින්න නිවුනා. ඒත් ඒ එදා...... අද ගොවියාට මුහුණ දීමට සිදුවී ඇත්තේ ඊට හාත්පසින්ම වෙනස් වූ තත්ත්වයකට දහඩිය මහන්සිය වපුරා වගා කර ගන්නා දෙයට සමහර විට ලැබෙන්නේ ඉතා අඩු මුදලක්, ඇතැම් විට සතයක්වත් නොලබා විනාශ වෙන අවස්ථාවන්ද පවතිනවා. ඒ විතරක් නෙමෙයි. ගිය වියදම පියවා ගැනීමටවත් විකුණාගත නොහැකි තත්ත්වයකට ද ගොවියාට ඇතැම් විට මුහුණ දීමට සිදු වෙනවා. අතීතයේදි නම් කායික මහන්සිය වැය කළ තරමටම මානසික තෘප්තියක් ගොවියාට තිබුණු බවයි මට නම් හැඟෙන්නේ. එදා ඔවුන්ගේ අටු කොටු පිරී තිබිලා තියෙනවා. සමාජ ආර්ථික වශයෙන් ඔවුන්ට අඩුවක් පාඩුවක් වෙලා නැහැ. ගොවියා රජකමට සුදුසු යැයි කියන්න ඇත්තෙත් මේ නිසා. ඒත් අද........? අද ගොවියා හෙළන දහඩියවල වටිනාකම ඔවුන්ට ලැබෙනවාද? මානසික වශයෙන් සැනසීමක් ඔවුන්ට තිබෙනවාද? අද වෙළඳපොළ දිහා බැලුවත් පේන්නේ දහඩිය මහන්සිය වපුරන අයට වඩා ඒකේ ලාභය ලබන්නේ වෙනත් පිරිසක් බවයි.

නිදසුනක් විදිහට මෙහෙම කියන්න පුළුවන්. 1998 මැයි මාසේ 15-21 දක්වා සතිය තුළදී ලැබුණු දත්ත අනුව හඟුරන්කෙත ප්‍රදේශයේ බෝංචි කිලෝවකට ගොවියාට ලබාදී ඇත්තේ රු.26.00 - 30.00 අතර මිළක්. එම සතිය තුළදී කොළඹ තොග වෙළඳපොළේ බෝංචි කිලෝවක් රු.40.00- 62.00 අතර මිළකට අලෙවි කර තිබුණු අතර, සිල්ලර වෙළඳපොළවල අලෙවි කර තිබුණේ රු.45.00 - 100.00 අතර මිළකට. ඒ කියන්නේ ගොවියා රු.26.00 - 30.00 අතර මුදලක් ලබා ගන්නා විට කොළඹ සිල්ලර වෙළෙන්දා රු 45.00 - 100.00 ත් අතර මුදලක් ලබා ගන්නවා. මේ දවස්වල වෙළඳපොළේ දෙහි මිළත් හරිම ඉහළයි. වෙළඳ පොළට දෙහි සපයන ප්‍රධාන ප්‍රදේශයක් තමයි මොණරාගල. මොණරාගල ප්‍රදේශයේ මේ සතිය තුළදී දෙහි කිලෝවකට ගොවියාට ලැබිලා තිබුණේ රු.80.00 - 100.00 ත් අතර මිළක් කොළඹ තොග වෙළඳපොළේ දෙහි කිලෝවක මිළ රු.120.00 - 130.00 ත් අතර පැවතුනා. ඒත් සිල්ලර වෙළඳපොලේ නම් දෙහි කිලෝවකට රු.160.00 - 210.00 අතර මිළක් ගෙවන්න සිදුවෙලා තිබුණා. ඒ කියන්නේ ගොවියා සහ කොළඹ සිල්ලර වෙළෙන්දා අතර මිළ පරතරය කිලෝවකට රු.80.00 - 110.00 ත් අතර වෙලා තිබුණා. තොග වෙළෙන්දා සහ සිල්ලර වෙළෙන්දා අතර පරතරය කිලෝවකට රු.30.00 - 80.00 ත් අතර වුණා. මෙයිනුත් පෙනී යනවා ගොවියාට ලැබෙන්නේ අඩු මිළක් කියලා. (ආහාර ද්‍රව්‍ය විවරණිකාව - 1998 20 වෙනි කලාපය)

ඒ කොහොම වුනත් ගොවියාට හැම තැනදීම සාධාරණයක් වෙනවා නම් හොඳයි. සමහර කාලවලදී ගොවීන්ට ඔවුන්ගේ අස්වනුවලට සරිලන මිළක් ලැබෙන්නේම නැහැ. මීට හොඳම නිදසුනක් තමයි එක් අවස්ථාවක ගෝවා කිලෝවක් ශත 50 කට රු.1.00 කට වැනි මිළකට විකුණන්න සිදුවීම. එවන් අවස්ථාවල ගොවීන්ගේ මානසිකත්වයේ පසු බැසීම නිසා එවැනි බෝග වගා කරන්නවත් ඔවුන් පෙළඹෙන්නේ නැහැ. ඉතින් ගොවියාට හැම අවස්ථාවකදීම හැම බෝගයකටම සාධාරණ මිළක් ලැබෙනවානම් ඒක ලොකු දිරියක්. මොකද තොග වෙළෙන්දා ආහාර බෝග අලෙවි කරන්නේ ලාභ ලබන්නේ ගොවීන් විසින් වගා කළොත් පමණයි. මේ නිසා අප පළමුව රැකගතයුතු වන්නේ ගොවියාවයි. ගොවි ප්‍රශ්න විසඳා ගොවියාට සාධාරණයක් ඉටු කරනවානම්, කොතැනක හරි වැරදිලා තියෙනවානම් ඒක හදන්න උත්සාහ ගන්නවානම් එතැනයි නියම ජයග්‍රහණය.

**පී.එම්.එල්.පී. නයනදර්ශනී විසිනි.**